**ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය**
කොළඹ
**ප්‍රවෘත්ති නිවේදනය**
මහජන කටයුතු අංශය
දුරකථන: +94 (11) 249-8100 ● ෆැක්ස්: +94 (11) 244-9070
විද්‍යුත් තැපැල: MannDT@state.gov ●වෙබ්: http://lk.usembassy.gov

නිවේදන අංක: 20210706

**ශ්‍රී ලංකාවේ කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීමට**

**එක්සත් ජනපදයෙන් ඇ. ඩොලර් මිලියන 75ක් ලබාදෙයි**

ජූලි 6 වැනි දා, කොළඹ දී - එක්සත් ජනපදය, වසංගතයේ බලපෑම් හේතුවෙන් ගැටළුවට පත් වී සිටින ශ්‍රී ලාංකීය කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර ශක්තිමත් කිරීම සඳහා සාධනීය දිරිගැන්වීමක් ලබාදීමට කටයුතු කර තිබේ. ඒ අනුව, එක්සත් ජනපදයේ ජාත්‍යන්තර සංවර්ධන මූල්‍ය සංස්ථාව (DFC) කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර අංශය, විශේෂයෙන්ම කාන්තා ව්‍යාපාර හිමියන් ව්‍යාප්තිය සහ ශක්තිමත් කිරීම සඳහා කරගෙන යන කටයුතුවලට සහය පිණිස NDB බැංකුව වෙත ඇ. ඩොලර් මිලියන 75ක අරමුදල් ප්‍රවාහයක් ලබාදෙනු ඇත. මෙම අරමුදල් සැපයීමේ එකඟතාවය අනුව එම ණයමුදලින් කොටසක් කාන්තාවන්ට හිමි, කාන්තා නායකත්වය සහිත, හෝ කාන්තාවන් සවිබලගන්වන්නා වූ නිෂ්පාදනයක් හෝ සේවාවක් සපයන ව්‍යාපාර වෙත ලබාදිය යුතු වේ.

'මූල්‍ය කරා ඇති ප්‍රවේශය වැඩිදියුණු කිරීම ශ්‍රී ලංකාවේ ව්‍යාපාර හිමි කාන්තාවන්ට තමන්ගේ පූර්ණ ආර්ථික විභවය සාක්ෂාත් කරගැනීමට උපකාරී වනු ඇති අතර ශ්‍රී ලංකාවේ ආර්ථිකය වර්ධනයටත් එය උපකාරී වනු ඇති,' යනුවෙන්, ශ්‍රී ලංකාවේ එ.ජ. තානාපතිනි ඇලෙයිනා බී. ටෙප්ලිට්ස් මහත්මිය පැවසුවාය. "තමන්ගේ සංවිධාන විසින් සහ ඒවා තුළ යෝජ්‍ය කළමනාකාරීත්ව තනතුරු සඳහා කාන්තාවන් සේවයේ යෙදවෙන බව සහතික කරගැනීමට එක්සත් ජනපදය කැපවී සිටිනවා."

DFC යනු එක්සත් ජනපද ෆෙඩරල් රජයේ සංවර්ධන මූල්‍ය ආයතනය වන අතර, අඩු හා මැදි ආදායම් රටවල පෞද්ගලික සංවර්ධන ව්‍යාපෘති මූල්‍යකරණය සඳහා විධිවිධාන සැලසීම හා පහසුකම් සැලසීම සඳහා එය ප්‍රධාන වශයෙන්ම වගකියයි. මෙම සහය ලබාදෙන්නේ, මූල්‍ය සර්වග්‍රාහීත්වය, ස්ත්‍රීපුරුෂ සමාජභාව සාධාරණත්වය, සහ කාන්තා මූලික සංවිධාන සඳහා සහයදීම අරමුණු කරගත්, NDB බැංකුවේ කාන්තා මුලපිරීම් සම්බන්ධ බැංකුකරණ වැඩසටහන සමගින් සමපාත වන DFC හි 2X කාන්තා මුලපිරීමේ කොටසක් වශයෙන් වේ.